**ශීර්ෂය 210 - ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 210 - ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 නොවැම්බර් 29 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

-------

### 2.1 විසර්ජන ගිණුම

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 239.00 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 212.97 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 26.03 ක් හෙවත් සියයට 10.89 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 212.50 | 190.19 | 22.31 | 10.50 |
| මූලධන | 26.50 | 22.78 | 3.72 | 14.04 |
| එකතුව | 239.00 | 212.97 | 26.03 | 10.89 |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 21001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 8.50 | 8.49 | 7.00 | 7.25 | 40.00 | 29.23 |

## 2.3 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වන අංක 7002/0000/00/0246/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 1.34 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වන අංක 6000/0000/00/0016/0075/000 දරන පොදු තැන්පත් ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 8.66 ක් විය.

## 2.5 විගණන නිරීක්ෂණය

ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 03 ඡේදයේ සඳහන් කර ඇත.

# 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනය පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

**3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම**

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී නිකුත් කරන ලද විගණන විමසුම් 05 කට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුමකට 2017 නොවැම්බර් 30 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුම්වලට අදාළව ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.3,454,947 ක් විය.

**3.3 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

වැය විෂයයන් 12 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්වලට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 85 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.4 අග්‍රිම ගිණුම්**

2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2)ට පටහැනිව මාණ්ඩලික නොවන නිලධාරීන් 9 දෙනෙකුට අවස්ථා 17 කදී එකතුව රු.1,018,831ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

**3.5 පොදු තැන්පත් ගිණුම**

පොදු තැන්පත් ගිණුමේ ශේෂයේ අන්තර්ගත වසර 02 ක් ඉක්මවූ තැන්පතුවල වටිනාකම රු.8,599,662 ක් වූ අතර, ඉන් රු.8,374,675 ක් වසර 04 ක් ඉක්මවූ තැන්පතු විය. මෙම තැන්පතු මුදල් රෙගුලාසි 571(3) හි විධිවිධාන ප්‍රකාරව රාජ්‍ය ආදායමට බැර කිරීමට හෝ හැකි ඉක්මනින් ආපසු ගෙවීමට සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

**3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 21001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී, සේවය අත්හැර ගොස් ඇති නිලධාරීන් තිදෙනෙකුගෙන් රු.241,593 ක් හා මියගිය නිලධාරියෙකුගෙන් රු.19,679 ක් වසර 15 ක සිට පැවත එමින් තිබුණ ද, එම ණය ශේෂ විගණිත දිනය වූ 2017 ජූනි 27 වන විටත් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**3.7 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.7.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය, අක්මුදල් අවශ්‍යතා සැලැස්ම, අභ්‍යන්තර විගණන සැලැස්ම යනාදිය ඇතුළත් කර නොතිබුණි.

### 3.7.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

විගණනය වෙත ඉදිරිපත් කර තිබුණු වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මේ පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශයේ (අ) සහ (ආ) වගන්ති ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 3.7.3 අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබූ අතර, අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදුකර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණන විමසුම් 07 ක් නිකුත්කර තිබූ නමුත් එයින් අභ්‍යන්තර විගණන විමසුම් 06 ක් සඳහා දෙපාර්තමේන්තුවේ කළමනාකරණය විසින් පිළිතුරු ලබාදී නොතිබුණි.

### 3.7.4 විගණන හා කළමනාකරණ කමිටුව

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජී/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව අවම වශයෙන් කාර්තුවකට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පැවැත්විය යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

### 3.8 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

#### (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

(i) නිසි පරිදි ශක්‍යතා අධ්‍යනයක් සිදු නොකර සියයට 2.1 ක පොලී අනුපාතිකයක් මත 1999 දෙසැම්බර් 10 දින සැපයුම්කරු හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සමඟ එළඹී ගිවිසුමට අනුව ප්‍රංශ රජයෙන් ලැබූ ණය ආධාර යටතේ ප්‍රංශ ප්‍රෑන්ක් 9,150,000 (යූරෝ 1,442,601) කට සමාන රු.මිලියන 102.2 කට 2003 වර්ෂයේදී මිලදී ගෙන තිබූ වර්ණ රසායනාගාර උපකරණ 2017 ජූලි වන විටත් නිෂ්ක්‍රීයව හා නිසි නඩත්තුවකින් තොරව පැවතුණි. මේ සම්බන්ධයෙන් 2010 වර්ෂයේ ත්‍රිපුද්ගල කමිටුවක් පත්කර තිබූ අතර, එහි නිර්දේශය වූයේ ප්‍රසිද්ධ ලංසු කැඳවීමක් මඟින් අලෙවි කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීම වුවත් 2017 ජූලි 31 දින වන විටත් දෙපාර්තමේන්තුව ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) දෙපාර්තමේන්තුවේ ශබ්ද අංශයේ 160 KVA ධාරිතාවයකින් යුත් ජෙනරේටරයක් මිලදී ගැනීම සඳහා 2015 ඔක්තෝබර් 12 දින ලංකා විදුලිබල මණ්ඩලය වෙත රු.1,201,480 ක් ගෙවා තිබුණද එම ජෙනරේටරය 2017 ජූනි 30 දින වන විටත් සවිකර නොතිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 507 (2) වගන්තිය, මුදල් රෙගුලාසි 757 (2) වගන්තිය හා 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2.6 ඡේදය ප්‍රකාරව 2016 භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2017 ජූනි 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් 2017 සැප්තැම්බර් 30 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.4 ඡේදය ප්‍රකාරව 2013, 2014 හා 2015 වර්ෂයන්ට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

**3.9 විසඳා නොතිබුණි විගණන ඡේද**

-----------------------------------

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කිරීම් කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2014 | 4.2 | 2007 පෙබරවාරි 24 දිනැති අංක සීඑස්ඒ/පී1/40/2007 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛයට පටහැනිව මාධ්‍ය සංවර්ධන සම්මන්ත්‍රණ/ සාකච්ඡා සඳහා අධික මිල ගණන්වලට සුඛෝපභෝගී කාමර පහසුකම් ලබාගැනීම වෙනුවෙන් රු.611,788 ක් වැය කර තිබුණි. ඒ වෙනුවෙන් වූ ලිපිලේඛන කිසිවක් දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන අංශය සතුව නොමැති බව 2015 නොවැම්බර් 24 දින පිළිගෙන තිබුණ ද, රජයට වූ අලාභය අයකර ගැනීමට 2017 මැයි 31 දින වන විටත් පියවර ගෙන නොතිබුණි. |
| 2014 | 4.13 | 2013 හා 2014 වර්ෂවල මාධ්‍ය සාකච්ඡා සඳහා ආහාර ලබා ගැනීමේදී රු.1,156,288 ක් වැඩිපුර ගෙවා තිබූ බව පිළිගෙන තිබුණ ද, වැඩිපුර ගෙවූ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| 2014 | 4.17 | පර්යේෂණ විෂය උපාධියේ විෂයයක් ලෙස හැදෑරූ නිලධාරීන් තිදෙනෙකු ඇතුළු නිලධාරීන් 07 දෙනෙකු සේවයේ නියුතු විශේෂ පර්යේෂණ ඒකකයක් දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කර තිබුණි. රටේ සංවර්ධනය පිළිබඳ ක්ෂේත්‍ර සමීක්ෂණයක් කිරීම එම අංශයට නොපවරා අවිධිමත් ලෙස ලංසු කැඳවා බාහිර ආයතනයකට පවරා රු.3,380,000 ක් ගෙවා තිබුණි. එම ආයතනය විසින් ලබාදුන් වාර්තාව කිසිදු කටයුත්තක් සඳහා හෝ ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| 2015 | 4.7 | ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ නව මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබූ රු.6,623,634 ක මුදල අයකර ගැනීමට ඉංජිනේරු සංස්ථාව නිර්දේශ කර තිබුණ ද එම වැඩිපුර ගෙවීම 2017 සැප්තැම්බර් 30 දින වන විටත් අයකරගෙන නොතිබුණි. |

**3.10 කළමනාකරණ දුර්වලතා**

-----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතාවය නිරීක්ෂණය විය.

දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගැනීමෙහිලා සුවිශේෂ කාර්යභාරයක් ඉටු කරන චිත්‍රපට අංශය සඳහා 2005 වර්ෂයේ සිට සෑම වර්ෂයකම උපකරණ සඳහා ඇස්තමේන්තු ඉදිරිපත් කර තිබුණ ද 2006 වසරේදී උපකරණ මිලදී ගැනීමෙන් පසු වසර 10 ක කාලයක් තුළ ප්‍රමාණාත්මක හා ගුණාත්මක උපකරණ මිලදී ගැනීම් සිදුකර නොතිබුණි.

**3.11 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා මාධ්‍ය සමාජයේ මත්පැන් විකිණීමේ බලපත්‍රය 2008 වර්ෂයේ සිට විධිමත් ගිවිසුමකින් තොරව බාහිර පුද්ගලයෙකුට පවරා තිබුණි. කෙසේ වුවද, ශ්‍රී ලංකා සුරාබදු කොමසාරිස් තුමාගේ ලිපිය අනුව 2016 වර්ෂය සඳහා එම ලිපිනයට බලපත්‍රයක් නිකුත් කර නොතිබුණි. එහෙත් පෙරදී අදාළ බලපත්‍රය බාහිර පාර්ශවයට පැවරීමෙන් අයවිය යුතු රු.4,653515 ක මුදල අයකර ගැනීමට හෝ නීති විරෝධී ලෙස මත්පැන් බලපත්‍රයක් අන්සතු කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විධිමත් ක්‍රියාමාර්ග කිසිවක් මේ දක්වා ගෙන නොතිබුණි.

(ආ) සංවර්ධනය පිළිබඳ මානව ආකල්ප විමසා බැලීමේ ක්ෂේත්‍ර සමීක්ෂණය සහ මානුෂික මෙහෙයුමට පෙර හා පසු දෙමළ ජනතාවගේ සුභසිද්ධිය සඳහා රජය ගත් ක්‍රියාමාර්ග හා එල්.ටී.ටී.ඊය මේ වන විට ජාත්‍යන්තරයේ ක්‍රියාත්මක වන ආකාරය ජාත්‍යන්තරයට හෙළි කිරීම සඳහා පර්යේෂණ නිබන්ධනයන් පිළියෙල කිරීම සැලසුම් කර තිබුණි. ඒ සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය නොකර රු.4,130,000 ක් මානව හා සංවර්ධනය පිළිබඳ කේන්ද්‍රය නමින් ගෙවා තිබුණි. එහෙත් එවැනි ආයතනයක් දක්වා ඇති ලිපිනයෙහි නොමැති බවත් අනාවරණය විය. එසේම ඉදිරිපත් කර තිබුණු අනෙක් ලංසුකරුවන් දෙදෙනාගේද ලිපිනයන් නොමැති බවද අනාවරණය විය. ඒ අනුව මෙම ප්‍රසම්පාදනයේදී නිවැරදිභාවය පිළිබඳ විගණනයේදී තහවුරු කරගැනීමට නොහැකි විය.

**3.12 මානව සම්පත් කළමනාකරණය**

--------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 17 | 08 | 09 |
| (ii) | තෘතියික මට්ටම | 16 | 04 | 12 |
| (iii) | ද්විතියික මට්ටම | 238 | 175 | 63 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 53 | 47 | 06 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 20 | 05 | 15 |
| | එකතුව | 344 | 239 | 105 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 105 ක් පිරවීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2013 වර්ෂයේ සැප්තැම්බර් 02 දිනැති ලිපිය මගින් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ (III, II, I) තාක්ෂණික නිලධාරි (ගොඩනැඟිලි අළුත්වැඩියා හා නඩත්තු) තනතුර අනුමත වී තිබූ නමුත් එම තනතුර සඳහා නිලධාරියෙකු බඳවා ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන වැඩ කටයුතු කිහිපයක් ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ පරිදි ක්‍රමානුකූලව සිදුකිරීමට නොහැකි වී තිබුණි. ඒ නිසා ප්‍රසම්පාදන කටයුතු වලදී වෙනත් ආයතනවල සේවකයන්ගේ සහය පැතීමට සිදුවී තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව සතුව රූ රටා (Graphic) නිර්මාණ ශිල්පියකු නොමැති නිසා සියලු රූ රටා සේවාවන් මුදල් ගෙවා බාහිර ආයතනවලින් ලබාගැනීමට සිදුවී තිබුණි. මීට පිළියම් වශයෙන් සිටින නිලධාරීන්ට රූ රටා නිර්මාණ පිළිබඳ පුහුණුවක් ලබාදීම හෝ නිලධාරියකු අලුතින් බඳවා ගැනීම හෝ සිදුකර නොතිබුණි.

(ඈ) කාර්ය මණ්ඩල පුහුණුව සඳහා වාර්ෂිකව මුදල් වෙන් කරනු ලැබුවද මානව සම්පත් කළමනාකරණ අත්පොතක් හෝ වෙනත් අනුමත නිශ්චිත ක්‍රමවේදයක් කාර්ය මණ්ඩල පුහුණුව සඳහා නොතිබුණි. චිත්‍රපට අංශය යොදා ගන්නා උපකරණවල තාක්ෂණය දියුණු වීම සමඟ ඊට සරිලන පරිදි දැනුමෙන් පරිපූර්ණ වියයුතු බැවින්, නිලධාරීන්ට උචිත පුහුණුවක් ලබාදීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.